# හර්ෂට තවත් ආයතන කිහිපයක්



**රුවීර දිලාන් මධුශංඛ**

ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් කැබිනට් නොවන අමාත්‍යාංශයේ ආයතන සංඛ්‍යාව වැඩිකර තිබේ.

එහි අමාත්‍ය ධුරය දරන ආචාර්ය හර්ෂ ද සිල්වාට මෙතෙක් තිබූ එකම ආයතනය විදේශ ජාතික ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පමණි.

ඊට අමතරව එම අමාත්‍යාංශය යටතට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, ජනතා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, පවුල් ආර්ථික ඒකකය, දත්ත විශ්ලේෂණ ඒකකය, 1990 සුවසැරිය පදනම, මහජන සැපයීම් කාර්ය සාධක බලකාය ද ඇතුළත් කර තිබේ.

ඊට අදාළ ගැසට් නිවේදනය පෙරේදා (16දා) ජනාධිපතිවරයා විසින් නිකුත් කර ඇත.

මේ අතර කම්කරු හා වෘත්තීය සබඳතා කැබිනට් නොවන අමාත්‍යාංශයට අදාළ ආයතනද ගැසට් කර තිබේ. ඒ අනුව එහි අමාත්‍ය ධුරය දරන රවීන්ද්‍ර සමරවීර මහතා යටතට කම්කරු දෙපාර්තමේන්තුව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, සේවක අර්ථසාධක අරමුදල, ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ශ්‍රම වාසනා අරමුදල, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, සීමාසහිත ශ්‍රී ලංකා රැකියා පියස හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල ද ගැසට් කර තිබේ.